**2018.04.26 වන දින පෙ.ව. 10.00 ට සීතාවක ප්‍රාදේශීය සභා කමිටු ශාලාවේදී පවත්වන ලද පරිසර හා පහසුකම් කාරක සභා රැස්වීමේ වාර්තාව.**

**සහභාගි වූ .**

1.ගරු කාරක සභා සභාපති - චන්දන මුදුන්කොටුව මැතිතුමා

2.ගරු කාරක සභික - ඔල්ගා අතුකෝරළ මැතිතුමිය.

3.ගරු කාරක සභික - බී. සනී හෙක්ටර් පිරිස් මැතිතුමා.

4.ගරු කාරක සභික - ආර්.ඒ. උපුල් මනෝජ් රූපසිංහ මැතිතුමා.

5.ගරු කාරක සභික - සුසන්ත සිසිර කුමාර රූපසිංහ මැතිතුමා.

6.ගරු කාරක සභික - ඩබ්.ඒ.ඩී. ගීතාමනි ස්වර්ණලතා මැතිතුමිය.

7.ගරු කාරක සභික - ඒ. සුසන්ත මැතිතුමා.

8.ගරු කාරක සභික - එම්.ඩී. සමන්ත කුමාර මැතිතුමා.

9.ගරු කාරක සභික - ආර්.ඒ.ඩී.සාගරිකා කුමාරි රූපසිංහ මැතිතුමිය.

10.ගරු කාරක සභික - එච්.එස්. සුනිල් රණසිංහ මැතිතුමා.

**සහභාගි නොවූ.**

1.ගරු කාරක සභික - ශෂිණි ශ්‍රීමාලි හෙට්ටිආරච්චි මැතිතුමිය.

**සහභාගි වූ නිලධාරීන්.**

1.ලේකම් - කේ.ඒ චන්දන පද්මසිරි මයා.

2.ප්‍රධාන කළමනාකරණ සහකාර - කේ.ඩී. සන්ධ්‍යා මාලනී මිය.

3. වැඩ අධිකාරි - ජයන්තා ජල්තොටගේ මිය.

4. කාර්යභාර නිලධාරි - කොස්ගම - රේණුකා ඉද්දමල්ගොඩ මිය .

5. කාර්යභාර නිලධාරි - පාදුක්ක - ඩී.සී.ජේ. අමරසිංහ මිය.

6. කාර්යභාර නිලධාරි - හංවැල්ල - සුමනා ජයසූරිය මිය.

7.තාක්ෂණ නිලධාරි - කොස්ගම - එච්.යූ නිශාන්ති මිය.

8.සංවර්ධන නිලධාරි -ආර්.පී.එන්.පී. ජිනදාස මයා.

9. සංවර්ධන නිලධාරි - ඉෂානි කමලිකා මිය

10.ආදායම් පරිපාලක - කහහේන - චන්දිම ජයලාල් රන්නෙත්ති මයා.

11. ආදායම් පරිපාලක - කොස්ගම - එච්.ඒ.ඩී.එස්. ප්‍රියන්ත මයා.

12. ආදායම් පරිපාලක - පාදුක්ක - වී.පී.සී.ඒ.කේ. පෙරේරා මයා.

13.කර්මාන්ත පරිපාලක - පාදුක්ක -එල්.ඒ.ඩී.සී. සම්පත් මයා.

14. සෞඛ්‍ය පරිපාලක - හංවැල්ල - බී. උපාලි මයා.

15.උප පොලිස් පරීක්ෂක - පාදුක්ක - කමල් ගුණතිලක මයා.

16.උප පොලිස් පරීක්ෂක- කොස්ගම - කේ.එච්.සුසිල් මයා.

17. උප පොලිස් පරීක්ෂක- හංවැල්ල - එස්.එම්.සී. නන්දන විජේසිරි මයා.

18. පරිපාලක මහජන සෞඛ්‍ය පරීක්ෂක - එම්.ඩබ්.එස්. ගයාන් මඩමවත්ත මයා.

19. පරිපාලක මහජන සෞඛ්‍ය පරීක්ෂක - ජී.ජී.යූ. දයානන්ද මයා.

20. මහජන සෞඛ්‍ය පරීක්ෂක - ප්‍රියන්ත යාපා මයා.

21.කාර්මික නිලධාරි - මාර්ග සංවර්ධන අධිකාරිය - එම්.කේ.ඩබ්. මල්කාන්ති මිය.

කාරක සභාවේ ගරු සභාපතිතුමා විසින් පැමිණ සිටි සියලුම දෙනා සාදරයෙන් පිළි ගත් අතර, සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ විශාල වශයෙන් පරිසර ප්‍රශ්න පවතින බවත් මෙම කාරක සභාව හරහා ඒ තත්වයන් සඳහා විසඳුම් සෙවීමට සියළුමදෙනාම කැපවීමෙන් යුතුව කටයුතු කරන ලෙසත් ඉල්ලා සිටිමින් ප්‍රථම පරිසර හා පහසුකම් කාරක සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී.

**<u>01. පෙර කමිටුවේ ප්‍රගතිය සලකා බැලීම</u>. -** නැත.

**<u>02.ලිපි ලේඛන සලකා බැලීම.</u>**

01.පළාත් පාලන හා පරිසර අමාත්‍යාංශ ලේකම් (බ.ප.) විසින් CM/WP/P/ENV/EC/2018 හා 2018.04.20 දිනැතිව සීතාවක සොබා දහම රැක ගැනීම යන මැයෙන් සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පිහිටා ඇති කුමාරි ඇල්ල, රන්මුදු ඇල්ල හා ඇල්ල උඩ ඇල්ල යන දියඇලි ඇතුළුව අනෙකුත් දොළවල දිය නෑමට පැමිණෙන පුද්ගලයින් විසින් නොයෙකුත් අපද්‍රව්‍ය ඒ අවට දමා යාම නිසා විශාල පරිසර දූෂණයක් සිදු වන බව වාර්තා වී ඇති බැවින් ප්‍රදේශයේ රාජ්‍ය ආයතන, පරිසර සංවිධාන සහ ප්‍රදේශවාසින්ගේ සහභාගිත්වය ඇතිව ශ්‍රමදානයක් සංවිධානය කර දන්වන ලෙස කර ඇති ඉල්ලීම හා වග, තුම්මෝදර රන්මුදුඇල්ල සහ ඉලුක්ඕවිට ලබුගම පාර ප්‍රදේශයේ පරිසර දූෂණය වැලැක්වීම සම්බන්ධයෙන් 2018.04.26 දිනැතිව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී උපුල් ප්‍රසන්න මැතිතුමා විසින් කරන ලද ලිපිය පිළිබඳව සලකා බැලූ කාරක සභාව, ශ්‍රමදානය පැවැත්වීමට මැයි මස අග දිනයක් යොදා ගැනීමට තීරණය කළ අතර, තවද මේ පිළිබඳව දීර්ඝ වශයෙන් සාකච්ඡා කළ අතර මෙසේ ක්‍රියාකරන්නන් සඳහා නීතිය ක්‍රියාත්මක කිරීම හා ලබුගම පාරට පොලිස් මුරපලක් ලබා දීමට හැකි නම් එයද ඉතා වටිනා බව සාකච්ඡා වූ අතර මේ සම්බන්ධයෙන් අදහස් දැක්වූ උප පොලිස් පරීක්ෂක එස්.එම්.සී. නන්දන විජේසිරි මහතා ප්‍රකාශ කර සිටියේ කොතරම් ජනතාව මේ සම්බන්ධයෙන් දැනුවත් කිරීම් කළද ඒ පිළිබඳව ඔවුන් තැකීමක් නොකරන බවත් මේ නිසා වාහන අනතුරුද සිදු වන බව හා පොලිස් මුරපලක් ලබා දීමට නිලධාරි හිගය වැනි යම් ගැටලුකාරි තත්වයන් පවතින බවත් මේ සම්බන්ධයෙන් පොලිස් ස්ථානාධිපතිතුමා වෙත ඉල්ලීමක් කරන ලෙසත් වැඩිදුරටත් ප්‍රකාශ කර සිටින ලදී. ඒ අනුව පොලිස් ස්ථානාධිපතිතුමාගෙන් මෙම ස්ථාන සඳහා පොලිස් මුරපොළක් ලබා දෙන ලෙස ඉල්ලීමක් කිරීමට කාරක සභාව තීරණය කරන ලදී.

02. බඳුවත්ත, ගොපල්ලමුල්ල පාර අංක 209/3 හි පදිංචි ටී.ඒ දීපිකා ප්‍රියදර්ශනී මිය විසින් ඇය පදිංචි නිවසට යාබදව පිහිටි ට්‍රොපිකල් ඇක්වා රිසෝසස් පුද්ගලික සමාගම විසින් පවත්වාගෙන යනු ලබන විසිතුරු මසුන් ඇති කිරීමේ කර්මාන්තයෙන් තමන්ට වන පීඩාවන් පිළිබඳව මධ්‍යම පරිසර අධිකාරියට කර ඇති පැමිණිල්ලට සම්බන්ධයෙන් ක්ෂේත්‍ර පරීක්ෂණයේදී අනාවරණය වූ කරුණු ඇතුළත් කරමින් WE/CM/PSW/MP/A53/16706/2017 හා 2018.04.11 දිනැතිව ලේකම්, සීතාවක ප්‍රාදේශීය සභාව, හංවැල්ල වෙත යොමු කරන ලද ලිපිය සම්බන්ධයෙන් සලකා බැලූ කාරක සභාව, මේ සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම සඳහා ප්‍රදේශය භාර මහජන සෞඛ්‍ය පරීක්ෂක වාර්තාවක් ලබා ගැනීම සුදුසු බවට කාරක සභාව තීරණය කරන ලදී.

03. කොස්ගම, සුමේධ විද්‍යාල පාර, විජේසුන්දර මාවත, අංක 300/3 හි පදිංචි නිමල් එදිරිසිංහ මයා විසින් 2018.03.22 දිනැතිව කොස්ගම නගරයේ අයාලේ යන ගවයින්ගෙන් ජනතාවට සිදු වන අනතුරු වලක්වා ගැනීම සඳහා සුදුසු පියවර ගන්නා මෙන් පුවත්පත් වාර්තාද ඇතුළත්ව ලේකම්, සීතාවක ප්‍රාදේශීය සභාව, හංවැල්ල වෙතද පිටපතක් සහිතව ගරු ප්‍රධාන අමාත්‍ය ඉසුර දේවප්‍රිය මැතිතුමා වෙත යොමු කරන ලද ලිපිය සම්බන්ධයෙන් දීර්ඝ වශයෙන් සාකච්ඡා කළ කාරක සභාව, සභාවේ මැදිහත් වීමෙන් අයාලේ යන ගවයින් ඇල්ලීම සඳහා සභාව විසින් පත් කරන ලද සේවකයා මිය ගොස් ඇති බැවින් ඒ සඳහා පත් කිරීමට සේවකයෙක් නොමැති වීම මත මෙම ගැටළුව පැන

නැගී ඇති බව ලේකම්තුමා විසින් කාරක සභාවට පැහැදිලි කරන ලදී. මේ සඳහා සුදුසු සේවකයෙක් බඳවාගෙන අයාලේ යන ගවයින්ගෙන් ජනතාවට සිදු වන අනතුරු වළක්වාලීමට අවශ්‍ය පියවර ගැනීම සුදුසු බවට කාරක සභාව තීරණය කරන ලදී.

04. 2018.04.18 දිනැතිව වග, කඩුගොඩ දකුණ , නො.269/2/1 හි පදිංචි ටී.චමින්ද පුෂ්පකුමාර මයා විසින් වග, කඩුගොඩ දකුණ නො.317/2 හි පදිංචි ඩබ්.කේ නිරෝෂන් වඩුවරාවගේ මයා විසින් පවත්වාගෙන යනු ලබන ඌරු හා කුකුල් ගොවිපල නිසා අවට ජිවත් වන ගම්වැසියන් හට විශාල දුෂ්කරතාවයන්ට මුහුණු පෑමට සිදු වන බැවින් එම ගැටළුවට විසඳුමක් ලබා දෙන ලෙස ඉල්ලා යොමු කරන ලද ලිපිය සලකා බැලූ කාරක සභාව, ඒ සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම සඳහා ප්‍රදේශය භාර මහජන සෞඛ්‍ය පරික්ෂක වාර්තාවක් ලබා ගැනිම සුදුසු බවට තීරණය කරන ලදී.

05.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයෝම මධු ප්‍රසාද් දේවගේ මැතිතුමා විසින් 2018.04.18 දිනැතිව පාදුක්ක නගර සීමාවේ දිරාපත් නොවන ප්ලාස්ටික් හා අනෙකුත් ද්‍රව්‍ය සීතාවක ප්‍රාදේශීය සභාව එකතු කළත් ඉදුල් වැනි දෑ රැගෙන නොයාම නිසා ප්‍රදේශයේ පර්චස් 10,15 වැනි කුඩා ඉඩම් වල ජිවත් වන ජනතාව විශාල ගැටළුවකට මුහුණ පා ඇති බව සඳහන් කරමින් ඉදිරිපත් කර ඇති ලිපිය සලකා බැලූ කාරක සභාව, ඉදිරියේදී එම ජනතාව වෙත කොම්පෝස්ට් බින් ලබා දීම සඳහා සුදුසු වැඩපිළිවෙලක් සකස් කර ඒ පිළිබඳව මන්ත්‍රීතුමා දැනුවත් කිරිම සුදුසු බවට තීරණය කරන ලදී.

06. කුඩාකන්ද ප්‍රදේශයේ ප්‍රජා ශාලාව ඉදිරිපිට ඉඩමේ විශාල වලක් හාරා කුකුළු හා ඌරන් ඇති කර මස් කරන අයෙකු විසින් එම අපද්‍රව්‍ය එම වලට දමන බව සඳහන් කරමින් හංවැල්ල, තුන්නාන, කුඩාකන්ද වසම, 444/ඊ ග්‍රාම සංවර්ධන සමිතිය විසින් මධ්‍යම පරිසර අධිකාරිය වෙත යොමු කරන පැමිණිල්ලට අනුව මධ්‍යම පරිසර අධිකාරිය විසින් WP/CM/PSW/WP-C-01-00414/2017 හා 2018.04.04 දිනැතිව ලේකම්, සීතාවක ප්‍රාදේශීය සභාව, හංවැල්ල වෙත යොමු කරන ලද ලිපිය සලකා බැලූ කාරක සභාව, ඒ සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම සඳහා ප්‍රදේශය භාර මහජන සෞඛ්‍ය පරික්ෂක වාර්තාවක් ලබා ගැනිම සුදුසු බවට තීරණය කරන ලදී.

07. හංවැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වග, කහහේන ප්‍රදේශයේ පවත්වාගෙන යනු ලබන කළු ගල් කැණීමේ කර්මාන්තය නිසා මිල්ලදණ්ඩ, එළමලවල ග්‍රාම සේවා වසමේ කඳු ප්‍රදේශය නාය යාමේ තර්ජනයට භාජනය වී ඇති බව සඳහන් කරමින් වග, කහහේන , අංක 299/බී හි පදිංචි ඩී.එච්.බී.ඩී. දේශප්‍රිය මහතා විසින් මධ්‍යම පරිසර අධිකාරියට කරන ලද පැමිණිල්ලට අනුව මධ්‍යම පරිසර අධිකාරිය විසින් 2018.04.03 දිනැතිව ලේකම්, සීතාවක ප්‍රාදේශිය සභාව වෙතද පිටපතක් සහිතව අධ්‍යක්ෂ ජනරාල්, ජාතික ගොඩනැගිලි හා පර්යේෂණ ආයතනය, ගොවිජන කොමසාරිස්, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව හා සාමාන්‍යාධිකාරි, ජල සම්පත් මණ්ඩලය වෙත යොමු කරන ලද ලිපි සලකා බැලූ කාරක සභාව, මේ හා සම්බන්ධ ආයතනයන් වන භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යාංශය, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, ජාතික ගොඩනැගිලි හා පර්යේෂණ ආයතනය, ජල සම්පත් මණ්ඩලය, ප්‍රාදේශිය ලේකම් - සීතාවක යනාදි ආයතන වෙත ලිපි මගින් දැනුම් දීමට තීරණය කරන ලදී.

08. පාදුක්ක ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයට අයත් පිටුම්පේ උතුර, පිටුම්පේ දකුණ වේවැල්පනාව හා ගලගෙදර නැගෙනහිර ග්‍රාම සේවා වසම් වලට මායිම්ව පිහිටි නූරානි වත්ත නම් වූ කඳු පන්තියේ පවත්වාගෙන යනු ලබන ගල් කොරි සම්බන්ධයෙන් මතු වී ඇති ගැටලු සම්බන්ධයෙන් පරික්ෂා කිරිම සඳහා 2018.03.27 වන දින පැවති ක්ෂේත්‍ර පරික්ෂණයේදී අනාවරණය වූ කරුණු සම්බන්ධයෙන් 2018.04.01 දිනැතිව පාදුක්ක, පිටුම්පේ, පූර්වාරාම විහාරස්ථානයෙහි සීතාවක පරිසරය සුරැකීමේ සංවිධානය විසින් සීතාවක ප්‍රාදේශිය සභාව වෙතද පිටපතක් සහිතව

අධ්‍යක්ෂ ජනරාල්, භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය වෙත යොමු කරන ලද ලිපිය සම්බන්ධයෙන් දීර්ඝ වශයෙන් කරුණු සාකච්ඡා කරන ලදී. මීපේ දෙකඳුවල ඇති ළිංවල ජලයෙහිද ඇමෝනියා මිශ්‍ර බවද වැඩි දුරටත් අදහස් දක්වමින් ගරු කාරක සභා සභික සමන්ත කුමාර මැතිතුමා පවසා සිටින ලදී. මේ සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගන්නා මෙන් අධ්‍යක්ෂ ජනරාල්, භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය වෙත දන්වා යැවීමට තීරණය කරන ලදී.

09.අංක 12 දිද්දෙණිය කොට්ඨාසය තුල මහා පරිමාණ ගල් කොරි 12 ක් පමණ ක්‍රියාත්මක වන බවත්, ඒ තුළින් ප්‍රදේශයේ ජනතාව දැඩි පීඩාකාරි තත්වයකට මුහුණ පා සිටින බවත්, ගල් පැටවූ ටිපර් රථ විශාල ප්‍රමාණයක් මාර්ගයේ ගමන් කිරිම නිසා මාර්ගයද දැඩි අබලන් තත්වයකට පත්ව ඇති බව හා මේ තුළින් සිදුවන දැඩි පරිසර හානිය පිළිබද සඳහන් කරමින් 2018.04.23 දිනැතිව ගරු කාරක සභා සභික ඩබ්.ඒ.ඩී.ජී. ස්වර්ණලතා මැතිතුමිය විසින් යොමු කරන ලද ලිපිය හා WP/CM/PSW/WPO/04/00127/2018 හා 2018.04.02 දිනැතිව හංවැල්ල, දිද්දෙණිය පාර, පතනකන්ද ආරාණ්‍ය සේනාසන භූමිය ආශ්‍රිත ඉඩමේ පස් කන්ද කැණීම සම්බන්ධ පැමිණිල්ල යන හිසින් යුතුව මධ්‍යම පරිසර අධිකාරිය විසින් යොමු කරන ලද ලිපිය සලකා බැලූ කාරක සභාව, මේ සම්බන්ධයෙන් සාකච්ඡා කිරිම සඳහා ඉදිරි පරිසර කාරක සභාව පැවැත්වෙන දින ප.ව 2.00 ට භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය, මධ්‍යම පරිසර අධිකාරිය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය යන ආයතන කැඳවීමට තීරණය කරන ලදී.

10.සීතාවක ප්‍රාදේශීය සභාවේ පරිසර හා පහසුකම් කාරක සභාව සඳහා දිද්දෙණිය, පහත්ගම, බදුවත්ත ගම් එකමුතුවෙන් පිහිටුවාගෙන ඇති සුරකිමු අපේ ගම සංවිධානයේ සභාපතිතුමාට හා ලේකම්තුමාට සහභාගි වීමට අවස්ථාවක් ලබා දෙන ලෙස ඉල්ලා ගරු කාරක සභික ඩබ්.ඒ.ඩී.ජී. ස්වර්ණලතා මැතිතුමිය විසින් 2018.04.26 දින කරනු ලැබූ ඉල්ලීම සලකා බැලූ කාරක සභාව, ඔවුන් ඉදිරි මස පැවැත්වෙන කාරක සභාව සඳහා කැඳවීමට තීරණය කරන ලදී.

11.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කෝකිල සම්පත් මැතිතුමා විසින් 2018.04.26 දිනැතිව රණවිරුගම හරහා ගලා බසින අපවිත්‍ර ඇල මාර්ගය පිරිසිදු කර ගැනීම යන හිසින් යුතුව 2018.04.26 දිනැතිව මේ සම්බන්ධයෙන් කළුඅග්ගල ප්‍රදේශය භාර මහජන සෞඛ්‍ය පරික්ෂක එච්.පී.සී.එස්. වීරසේකර මයාගේ වාර්තාව සහ ස්වර්ණ ජයන්ති රණවිරුගම සුභසාධක සමිතිය විසින් සාලාව යුධ හමුදා කඳවුර වෙත යොමු කරන ලද ලිපියද සමගින් ඉදිරිපත් කරන ලද ලිපිය සලකා බැලූ කාරක සභාව, ඇළ මාර්ගය පවිත්‍ර කිරිම සම්බන්ධයෙන් ඉදිරි කටයුතු ගැනීම සඳහා සාලාව යුධ හමුදා කඳවුර දැනුවත් කිරිමටත්, මාසයක් ඇතුළත ඒ සම්බන්ධයෙන් කටයුතු නොකළහොත් පරිසර කාරක සභාවට කැඳවීමටත් තීරණය කරන ලදී.

12.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.පී.ඒ.කේ. ගුණරත්න මැතිතුමා සීතාවක ප්‍රාදේශීය සභාවේ කසල ට්‍රැක්ටරය රන්වල පහන ළග සිට තුම්මෝදර හන්දිය දක්වාත්, වෙරගොල්ල ජන වසම මාර්ගය හරහා වෙරගොල්ල වත්තටද දක්වා දීර්ඝ කර දෙන ලෙස ඉල්ලා 2018.04.23 දිනැති ඉල්ලීම සලකා බැලූ කාරක සභාව, මේ සම්බන්ධයෙන් මේ අවස්ථාවේදී තීරණයක් ගත නොහැකි බවත්, ඒ පිළිබඳව පසුව සලකා බැලීම සුදුසු බවටත් තීරණය කරන ලදී.

13.බප/ හෝ සාන්ත ජෝන් බොස්කෝ මහා විද්‍යාලයේ කසල කළමනාකරණය කර ගැනීම සඳහා ප්ලාස්ටික් හා පොලිතින් අපද්‍රව්‍ය ඉවත් කර ගැනීමට අවැසි බැවින් ට්‍රැක්ටරය පාසලට යොමු කරන ලෙස ඉල්ලමින් 2018.04.23 දිනැතිව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.පී.ඒ.කේ. ගුණරත්න මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ලිපිය සලකා බැලූ

කාරක සභාවට, ඉදිරියේදී හංවැල්ල සෞඛ්‍ය අංශයට නොදිරන කසල ලබා ගැනීම සඳහා සතියට එක් දිනයක් යොදා ගන්නා ලෙස දැන්වීමට තීරණය කරන ලදී.

14. 2018.04.09 දිනැතිව ගරු කාරක සභික ඔල්ගා අතුකෝරල මැතිතුමිය විසින් හංවැල්ල පොලිස් ස්ථානාධිපතිතුමාටද පිටපතක් සහිතව ගොවිපලේ සංවර්ධන කටයුතු තාවකාලිකව අත්හිටුවන ලෙස දන්වා තිබුණද එසේ සංවර්ධන කටයුතු නවතා දැමීමට හැකියාවක් නොමැති බැවින් බලපත්‍ර කොන්දේසි අනුව තමා විසින් ඉදි කිරීම් කටයුතු සිදු කරන බව දන්වා යොමු කරන ලද ලිපිය සම්බන්ධයෙන් සලකා බැලූ කාරක සභාව, ගොවිපලෙහි අනුමත සැලැස්මට අනුව ඉදිකිරීම් කටයුතු සිදු කර නොමැති බවට නිරීක්ෂණය වී ඇති බව ලේකම්තුමා විසින් කාරක සභාවට දන්වා සිටින ලදී. ඒ අනුව අනුමත සැලැස්මට පටහැනිව ඉදිකර ඇති සියලු ඉදිකිරීම් වහාම අත්හිටුවන ලෙස දන්වා යැවීම සුදුසු බවට තීරණය කරන ලදී.

15.සීතාවක ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ඉදිරිපිට ඇති මාර්ග ආවරණය අසලින් පහළට ඇති ලන්ඩන් පාර්ක් නමැති වෙන්දේසි ඉඩමේ වැසි ජලය බැස යාමට ඇති කාණු වලට නිවෙස් වල අපද්‍රව්‍ය බැහැර කිරීම නිසා සිදු වී ඇති ගැටලුකාරි තත්වය සම්බන්ධයෙන් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි - අලුත් අම්බලම වෙතද පිටපතක් සහිතව ලන්ඩන් පාර්ක් වෙන්දේසි ඉඩම්ලාභින් විසින් ඉදිරිපත් කරන ලද ලිපිය සලකා බැලූ කාරක සභාව, ඒ සම්බන්ධයෙන් ප්‍රදේශය භාර මහජන සෞඛ්‍ය පරික්ෂක වාර්තාවක් ලබා ගැනීම සුදුසු බවට තීරණය කරන ලදී.

16. වැලිකන්න ග්‍රාම නිලධාරි වසම සඳහා පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියක් ලබා ගැනීම යන හිසින් යුතුව 2018.04.24 දිනැතිව ගරු කාරක සභික සුසන්ත රූපසිංහ මැතිතුමා විසින් යොමු කරන ලද ලිපිය සම්බන්ධයෙන් සලකා බැලූ කාරක සභාව, ඒ සම්බන්ධයෙන් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය දැනුවත් කිරීමට තීරණය කරන ලදී.

17. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුසන්ත රූපසිංහ මැතිතුමා විසින් 2018.04.24 දිනැතිව ඇල්ලකන්ද වැලිකන්න ප්‍රදේශයේ ඇල්ලකන්ද නව ජනපදයේ විජේරත්න මහතාගේ නිවස අසලින් උඩට ඇති මාර්ගයේ අවසානයට පොදු භාවිතය සඳහා වෙන් කර ඇති පොදු නාන ළිදට කසල දැමීම හා අවට පරිසරය අපිරිසිදු කිරීම සම්බන්ධයෙන් යොමු කරන ලද ලිපිය සලකා බැලූ කාරක සභාව, ඒ සම්බන්ධයෙන් ප්‍රදේශය භාර මහජන සෞඛ්‍ය පරික්ෂක වාර්තාවක් ලබා ගැනීම සුදුසු බවට තීරණය කරන ලදී.

18.හංවැල්ල, පහළ හංවැල්ල, අංක 166/ඒ -3 හි පදිංචි පී.එච්.ඩී.චන්ද්‍රිකා මිය විසින් 2018.04.25 දිනැතිව කැළණි ගඟ අද්දර නීති විරෝධි සතුන් මැරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම යන හිසින් යුතුව ඡායාරූපද සමගින් ඉදිරිපත් කරන ලද ලිපිය සලකා බැලූ කාරක සභාව, ඒ සම්බන්ධයෙන් ප්‍රදේශය භාර මහජන සෞඛ්‍ය පරික්ෂක වාර්තාවක් ලබා ගැනීම සුදුසු බවට තීරණය කරන ලදී.

19.නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය යටතේ වන නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය මගින් USDA/SM/05/791 හා 2018.03.21 දිනැතිව ප්‍රජා ක්‍රියාකාරි වැඩමුළු තුළින් මුණමලේවත්ත ජනාවාසයේ හඳුනා ගත් ප්‍රජා අවශ්‍යතා හා ගැටලු සම්බන්ධව යොමු කර ඇති ලිපිය සලකා බැලූ කාරක සභාව, මෙ ගැටලු සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා ප්‍රජා සංවර්ධන නිලධාරිය හරහා වැඩසටහනක් සකස් කර ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට තීරණය කරන ලදී.

20. ගරු කාරක සභික සුසන්ත රූපසිංහ මැතිතුමා විසින් 2018.04.24 දිනැතිව හංවැල්ල නගරයේ ඇති පොදු වැසිකිළිය

නිසි පරිදි නඩත්තු නොකරන බව සඳහන් කරමින් යොමු කරන ලද ලිපිය සම්බන්ධයෙන් දිර්ඝ වශයෙන් සාකච්ඡා කල කාරක සභාව, දැනට එම වැසිකිලයේ අඩුපාඩු සකස් කිරිමටත්, ඉදිරියේදී ජනතාවගේ අවශ්‍යතාවයට සරිලන ආකාරයේ පහසුකම් සහිත වැසිකිලි පද්ධතියක් සකස් කිරිම සඳහා ඇස්තමේන්තු සකස් කිරිමට තීරණය කරන ලදී.

21.ගලගෙදර, මීපේ හන්දිය ආශ්‍රිත කම්මල්පිටිය වත්ත, මීපේ වත්ත, දෙකදුවල හා ප්‍රින්ස්ටන් පාක් ප්‍රදේශ කුඩා ඉඩම් ප්‍රමාණ වල ජීවත් වන ජනතාව නොදිරන කසල එකතු කිරිමේ ක්‍රමවත් වැඩපිළිවෙලක් නොමැති වීම නිසා පීඩාවට පත්ව ඇති බව සඳහන් කරමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ගමගේ චන්ද්‍රසිරි මැතිතුමා විසින් 2018.04.25 දිනැතිව යොමු කරන ලද ලිපිය සම්බන්ධයෙන් සලකා බැලු කාරක සභාව, දැනට සෙනසුරාදා දින ක්‍රියාත්මක කරනු ලබන නොදිරන කසල එකතු කිරිමේ වැඩසටහන යටතේ එම ප්‍රදේශයේ නොදිරන කසල එකතු කිරිමට යොදා ගැනීමට තීරණය කරන ලදී.

22.පාදුක්ක, අරුක්වත්ත, අංගමුව පාර ප්‍රදේශවාසින්ගේ අත්සන් යුතුව පාදුක්ක අරුක්වත්ත හන්දියෙන් අංගමුව, මීරියගල්ල මාර්ගයේ ජයන්ති මාවතෙහි පවත්වාගෙන යනු ලබන කුකුළු ගොවිපලක් හේතුවෙන් ඇති වී තිබෙන ගැටලුකාරි තත්වය පිළිබඳව 2018.03.07 දිනැතිව යොමු කරන ලද ලිපිය සම්බන්ධයෙන් සලකා බැලු කාරක සභාව, ඉදිරි කටයුතු සඳහා ප්‍රදේශය භාර මහජන සෞඛ්‍ය පරික්ෂක වාර්තාවක් ලබා ගැනීම සුදුසු බවට තීරණය කරන ලදී.

23. ගලගෙදරග්‍රාමයේ වැසි ජලය බැස යාමට ඇති ස්ථාන අවහිර වන සේ ඉදිකර ඇති ඉදිකිරිම් හේතුවෙන් එහි පදිංචිකරුවන් දෙදෙනෙකුගේ නිවෙස් වලට සිදුව ඇති හානිය සම්බන්ධයෙන් එම පුද්ගලයින්ගේද ඉල්ලිම් සහිතව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ගමගේ චන්ද්‍රසිරි මැතිතුමා විසින් 2018.04.25 දිනැතිව යොමු කරන ලද ලිපිය සම්බන්ධයෙන් සලකා බැලු කාරක සභාව, මේ සම්බන්ධයෙන් තාක්ෂණ නිලධාරි වාර්තාවක් ලබා ගෙන එය ඊළග කාර්මික සේවා කාරක සභාවට ඉදිරිපත් කිරිමට තීරණය කරන ලදී.

24. මධ්‍යම පරිසර අධිකාරිය විසින් WP/CM/PSW/FD/A40//12254/2014 හා 2018.03.27 දිනැතිව පරිසර ආරක්ෂණ බලපත්‍රය, සුබර ගොවිපල, අංක 15, මාවල්ගම, වග යන හිසින් යුතුව වග, මාවල්ගම, නො.15 හි එච්.ඒ.ටී. දර්ශන ද සිල්වා යන අය වෙත යොමු කරන ලද ලිපියේ පිටපතක් ලේකම්, සීතාවක ප්‍රාදේශීය සභාව වෙතද යොමු කරන ලද ලිපිය සම්බන්ධයෙන් සලකා බැලු කාරක සභාව, ප්‍රදේශය භාර මහජන සෞඛ්‍ය පරික්ෂක වාර්තාවක් ලබා ගැනීමෙන් පසු ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම සුදුසු බවට තීරණය කරන ලදී.

25. මධ්‍යම පරිසර අධිකාරියේ සභාපතිතුමා විසින් 07/WM/172/2016/111 හා 2017.02.17 දිනැති ලිපියෙන් අවිධිමත් පොලිතින් භාවිතය තුළින් ඇති වන පාරිසරික ගැටළු අවම කිරිම සඳහා ක්‍රියා කරන ලෙස දන්වා එවා ඇති ලිපියේ පිටපතක්ද සමගින් පළාත් පාලන සහකාර කොමසාරිස් (කො.දි.) විසින් ACLG/CO –10/කසල ක. /2018 හා 2018.02.05 දිනැතිව යොමු කරන ලද ලිපිය සම්බන්ධයෙන් සාකච්ඡා කළ කාරක සභාව ඉදිරියේදී ඒ අනුව කටයුතු කිරිමට තීරණය කරන ලදී.

26. සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි පාදුක්ක හා හංවැල්ල විසින් ඉදිරිපත් කරන ලද 2018 මාර්තු මාසයේ ඩෙංගු මර්ධන කටයුතු පිළිබඳ මාසික වාර්තාව සම්බන්ධයෙන් කාරක සභාව විසින් සාකච්ඡා කරන ලද අතර, කොළඹ දිස්ත්‍රික්කයේ අඩුම ඩෙංගු රෝගීන් සංඛ්‍යාවක් වාර්තා වන්නේ පාදුක්ක සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි බල ප්‍රදේශයේ බවත් මේ සඳහා පසුගිය දිනවල සභාවෙන් ලබා දුන් සහයෝගය මත සාර්ථකව ඩෙංගු මර්ධන වැඩසටහන

ක්‍රියාත්මක කළ බව පරිපාලක මහජන සෞඛ්‍ය පරික්ෂක ගයාන් මඩමවත්ත මයා විසින් අවධාරණය කළ අතර පාදුක්ක හා හංවැල්ල නගර වල ක්‍රියාත්මක වන ඩෙංගු මර්ධන වැඩසටහන්ද ඉතා සාර්ථකව ක්‍රියාත්මක වන බවද පරිපාලක මහජන සෞඛ්‍ය පරික්ෂක මහතුන් විසින් අදහස් දැක්වූහ.

27. 2018 ජනවාරි, පෙබරවාරි හා මාර්තු මාසයට අදාලව සීතාවක ප්‍රාදේශීය සභාවට අයත් කොම්පෝස්ට් පොහොර නිෂ්පාදන හා ප්‍රතිචක්‍රිකරණ ද්‍රව්‍ය වල ප්‍රමාණයන් පිළිබඳ දත්ත ලේකම්තුමා විසින් කමිටුවේ දැන ගැනීම සඳහා ඉදිරිපත් කල අතර, එහි වර්තමාන තත්වය හා එය ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳවද ලේකම්තුමා විසින් දිර්ඝ වශයෙන් කාරක සභාව වෙත කරුණු ඉදිරිපත් කරන ලදී.

**<u>03.සාකච්ඡා සටහන්.</u>**

01.හංවැල්ල නගරයේ පවිත්‍රතාවය පිළිබඳව ගැටලුකාරි තත්වයන් පවතින බවට කරුණු ඉදිරිපත් වු අතර, කාණුවල වතුර රැදීම, අනවසර කඩ හා මාළු කඩවල අපද්‍රව්‍ය කාණු වලට මුදා හැරීම් පිළිබඳව මහජන සෞඛ්‍ය පරික්ෂක වාර්තාවක් ලබා ගැනිම සුදුසු බවට යෝජනා විය.

02.කොස්ගම සතිපොළෙහි මාළු කඩවල අපද්‍රව්‍ය මාර්ගයට මුදා හැරිම සම්බන්ධයෙන් කටයුතු කිරිමට හා කොස්ගම නගරයේ පහසුකම් සපිරි වැසිකිලි පද්ධතියක් සකස් කිරිම සම්බන්ධයෙන්ද කරුණා සාකච්ඡා කරන ලදී.

03.කොස්ගම සතිපොළ සතියකට දින 06 ක් පැවැත්වෙන නිසා පිරිසිදු කිරිමේ කටයුතු සිදු කිරිම සම්බන්ධයෙන් දැඩි අපහසුතාවකය පත් වන බව ලේකම්තුමා විසින් කාරක සභාව වෙත අදහස් දක්වන ලද අතර, කොස්ගම සතිපොළ ඉදිරියේදී ඇති අනවසර කඩ පේළිය සම්බන්ධයෙන්ද මාර්ග සංවර්ධන අධිකාරිය නියෝජනය කරමින් පැමිණ සිටි කාර්මික නිලධාරිතුමිය විසින් කරුණු ඉදිරිපත් කරන ලද අතර මේ ගැටලුකාරි තත්වයන් සම්බන්ධයෙන් සාකච්ඡා කිරිමට පොළ සඳහා සමිතියක් ඇත්නම් ඒ සමිතිය දැනුවත් කිරිම සුදුසු බවට කරුණු ඉදිරිපත් වු අතර සමිතිය සමග සාකච්ඡා කර ඉදිරියේදී දිනයක් යොදාගෙන කාරක සභාව වෙත දැනුම් දෙන ලෙසට ගරු කාරක සභික සුනිල් රණසිංහ මැතිතුමා වෙත දැනුම් දෙන ලදී.

04.පහළ හංවැල්ල පිලිප් මාවත පිලිසකර කර දෙන ලෙස ගරු කාරක සභික ඒ. සුසන්ත මැතිතුමා විසින් ඉල්ලා සිටින ලදී.

05. මේ වන විට අතහරින ලද ගල් වලවල් වල වතුර රැදී තිබෙන බැවින් ඒ තුළින් මදුරුවන් බෝ වන බවට ගරු කාරක සභික ගීතාමනි ස්වර්ණලතා මැතිතුමිය විසින් මහජන සෞඛ්‍ය පරික්ෂක මහතුන් වෙත කරුණු ඉදිරිපත් කරන ලදී.

අද දින පැවති පරිසර හා පහසුකම් කාරක සභා රැස්වීමේදී ගන්නා ලද ඉහත සඳහන් තීරණ ඇතුළත් පරිසර හා පහසුකම් කාරක සභා වාර්තාවට එකග වෙමින් පහත අත්සන් තබමි.

1. ගරු කාරක සභා සභාපති - චන්දන මුදුන්කොටුව මැතිතුමා

.............................................

2. ගරු කාරක සභික - කේ.ඒ.ඩී. පිලිෂියා ඇනට් ඔල්ගා අතුකෝරළ මැතිතුමිය

.............................................

3. ගරු කාරක සභික - බී. සනී හෙක්ටර් පිරිස් මැතිතුමා.

.............................................

4. ගරු කාරක සභික - ආර්.ඒ. උපුල් මනෝජ් රූපසිංහ මැතිතුමා.

.............................................

5. ගරු කාරක සභික - සුසන්ත සිසිර කුමාර රූපසිංහ මැතිතුමා.

.

.............................................

6. ගරු කාරක සභික - ඩබ්.ඒ.ඩී. ගීතාමනි ස්වර්ණලතා මැතිතුමිය.

.............................................

7. ගරු කාරක සභික - ඒ. සුසන්ත මැතිතුමා.

.............................................

8. ගරු කාරක සභික - එම්.ඩී. සමන්ත කුමාර මැතිතුමා.

.............................................

9. ගරු කාරක සභික - ආර්.ඒ.ඩී.සාගරිකා කුමාරි රූපසිංහ මැතිතුමිය.

.............................................

10. ගරු කාරක සභික - එච්.එස්. සුනිල් රණසිංහ මැතිතුමා.

.............................................

කාරක සභාවේ වැඩ කටයුතු ප.ව. 13.10 ට නිමාවට පත් විය.

2018.04.26 වන දින,

සීතාවක ප්‍රාදේශීය සභා කමිටු ශාලාවේදී.